# 2018.05.22 වන දින පෙ.ව. 10.00 ට සීතාවක ප්‍රාදේශීය සභා කමිටු ශාලාවේදී පවත්වන ලද කාර්මික සේවා කාරක සභා රැස්වීමේ වාර්තාව.

**සහභාගී වූ :**

| | | |
|---|---|---|
| 1.ගරු කාරක සභා සභාපති | - | ලියනගේ චන්දන කුමාර මැතිතුමා. |
| 2.ගරු කාරක සභික | - | සමන්ත උදය කුමාර ගමගේ මැතිතුමා. |
| 3. ගරු කාරක සභික | - | එල්.නන්ද කුමාරසිංහ මැතිතුමා. |
| 4.ගරු කාරක සභික | - | එච්. වරුණ දිලිප් කුමාර මැතිතුමා. |
| 5.ගරු කාරක සභික | - | ඩබ්. අසෝක වැලිකල මැතිතුමා. |
| 6.ගරු කාරක සභික | - | ජී.කුමුදිනී ජයවර්ධන මැතිතුමිය. |
| 7.ගරු කාරක සභික | - | එම්.ඩී. මාලනී චන්ද්‍රලතා මැතිතුමිය. |
| 8.ගරු කාරක සභික | - | එන්.පී.කේ. සමන්ති චන්ද්‍රිකා දමයන්ති මැතිතුමිය. |

**සහභාගී නොවූ :**

| | | |
|---|---|---|
| 1.ගරු කාරක සභික | - | පී.කේ. උපුල් ජිනේන්ද්‍ර කුලතිලක මැතිතුමා. |
| 2.ගරු කාරක සභික | - | එච්.පී.උපුල් ප්‍රසන්න මැතිතුමා. |
| 3.ගරු කාරක සභික | - | කේ.නිමල් යසසිරි කළුපහන මැතිතුමා. |

**සහභාගී වූ නිලධාරීන් :**

| | | |
|---|---|---|
| 1. ලේකම් | - | කේ.ඒ. චන්දන පද්මසිරි මයා. |
| 2. කාර්යභාර නිලධාරී - පාදුක්ක | - | ඩී.සී.ජේ. අමරසිංහ මිය. |
| 3. කාර්යභාර නිලධාරී - කහහේන | - | ජී. චමරි පත්මලතා මිය. |
| 4. තාක්ෂණ නිලධාරී - පාදුක්ක | - | එන්.පී. දිවිගල්පිටිය මිය. |
| 5. තාක්ෂණ නිලධාරී - කොස්ගම | - | එච්.යූ. නිශාන්ති මිය. |
| 6. තාක්ෂණ නිලධාරී - හංවැල්ල | - | එල්.ඒ. ධර්මසේන මයා. |

කාරක සභාව සඳහා පැමිණි සියලුදෙනා සාදරයෙන් පිළිගත් ගරු සභාපතිතුමා කාරක සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

**01. පෙර කමිටුවේ ප්‍රගතිය.**

1. අනුර දේපල සමාගම විසින් ලබාදී ඇති ඉඩම් කොටස දල බෑවුමක් නිසා එහි ක්‍රීඩා පිටියක් ඉදිකළ නොහැකි බව සඳහන් කරමින්, ''වේරගොල්ලට ක්‍රීඩා පිටියක් ලබා ගැනීම." යන හිසින් යුතුව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අරුණ පී. දිවිගල්ල මැතිතුමා විසින් 2018.04.23 දිනැතිව යොමු කරන ලද ලිපිය සම්බන්ධයෙන් දැනට ක්‍රියාත්මක නොවන ලෙස මන්ත්‍රීතුමා තමන් දැනුවත් කළ බව තාක්ෂණ නිලධාරි විසින් කාරක සභාව දැනුවත් කරන ලදී.

2. ''ආනන්දගම පොදු සුසාන භූමියේ දැල්වැට ඉදිකිරීම" යන හිසින් යුතුව 2018.04.23 දිනැතිව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කෝකිල සම්පත් මැතිතුමා විසින් යොමු කරන ලද ලිපිය සම්බන්ධයෙන් තාක්ෂණ නිලධාරි වාර්තාවට අනුව මෙම සුසාන භූමිය සභාව සතු නොවන බැවින් එම ඉල්ලීම ඉටු කළ නොහැකි බවට කාරක සභාව තීරණය කරන ලදී.

3. දිද්දෙණිය දකුණ 439/ඒ ග්‍රාම සේවා වසමට අයත් සම්බුධිවත්තට ඇතුළුවන මාර්ගය තනි පුද්ගලයෙකු විසින් අවහිර කිරීමට අදාලව ''439/ඒ - දිද්දෙණිය දකුණ සම්බුධිවත්ත මාර්ගය අවහිර කිරීම හා නව මාර්ගයක් ඉදිකිරීම අත්හිටුවා ගැනීම" යන හිසින් යුතුව 2017.10.05 දිනැතිව ප්‍රදේශවාසීන් 19 දෙනෙකුගේ අත්සනින් යුත් ලේඛනයක් සමඟ යොමු කරන ලද ලිපිය සම්බන්ධයෙන් පරික්ෂණයක් සිදු කිරීමට පවතින අධික වර්ෂාව හේතුවෙන් නොහැකි වූ බැවින් ඉදිරි කාරක සභාව වෙත වාර්තාව හා දල ඇස්තමේන්තුව ඉදිරිපත් කරන බව තාක්ෂණ නිලධාරි විසින් දැනුම් දෙන ලදී.

4. VC නිවාස යෝජනා ක්‍රමයේ ඉදිකර ඇති දැල් වැට හා පැති බැම්ම හේතුවෙන් ආබාධිත පුද්ගලයන් හට සේවා පියසට ඇතුළුවීමට ඇති අපහසුතාවය දන්වා ''සාලාව සේවා පියසෙහි ඇති පැති බැම්ම ඉවත්කිරීම" යන හිසින් යුතුව 2018.04.23 දිනැතිව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කෝකිල සම්පත් මැතිතුමා විසින් යොමු කරන ලද ලිපිය සම්බන්ධයෙන් තාක්ෂණ නිලධාරි විසින් ලබා දුන් වාර්තාවට අනුව ප්‍රිමික්ස් යොදා සේවා පියසට ඇතුළු වීමට ඇති අපහසුතාවය ඉවත් කිරීමට කාරක සභාව තීරණය කරන ලදී.

5. සීවලී වත්ත කුසුම් නිවාස යෝජනා ක්‍රමයෙහි පාර දෙපස කාණු පද්ධතිය අවහිර වීමට අදාලව ''අනවසර ගොඩ කිරීමක් සම්බන්ධව" යන හිසින් යුතුව 2018.04.22 දිනැතිව හංවැල්ල, පහල හංවැල්ල, සීවලී නිවාස, අංක 128/8/8 ලිපිනයෙහි පදිංචි බී.කේ. නිශාන්ත රත්නසිරි මයා විසින් යොමු කරන ලද ලිපිය සම්බන්ධයෙන් තාක්ෂණ නිලධාරි විසින් ලබා දුන් වාර්තාවට අනුව, වැසි ජලය අවහිරතාවයකින් තොරව ගලා බැස යාමට කටයුතු කරන ලෙස අදාල නිවෙස් හිමියන් දැනුවත් කිරීම සුදුසු බවට කාරක සභාව තීරණය කරන ලදී.

6. ජයවිරගොඩ ප්‍රධාන මාර්ගයෙන් ආරම්භ වන අතුරු මාර්ගය ''ජයවීරගොඩ නා සෙවන පාර" වශයෙන් ප්‍රසිද්ධව ඇති බැවින් ''අතුරු පාරක් සඳහා නමක් ප්‍රසිද්ධ කිරීම" යන හිසින් යුතුව 2018.04.08 දිනැතිව හංවැල්ල, ජයවීරගොඩ, අංක 73/ ඒ ලිපිනයෙහි පදිංචි එච්. කීර්තිරත්න සිරිවර්ධන මයා විසින් ප්‍රදේශවාසීන් 37 දෙනෙකුගෙන් යුත් අත්සන් ලේඛනයක් සමඟ යොමු කරන ලද ලිපිය සම්බන්ධයෙන්, යෝජනාවක් මහා සභාව වෙත ඉදිරිපත් කරන ලෙසට අදාල මන්ත්‍රීතුමා දැනුවත් කිරීම සුදුසු බවට කාරක සභාව තීරණය කරන ලදී.

7. පාදුක්ක, බෝපේ, ගුරුලාන, අංක 183 හි පදිංචි ඇම්. සෝමදාස මහතා විසින් ඔහුට අයත් අංක 201/1, හයිලෙවල් පාර, ගලගෙදර පිහිටි කහටගහවත්ත නැමති ඉඩමට පින්නවල පදිංචි පී. සිරිසේන යන අයට අයත් ඉඩමෙන් වතුර පිටකිරීම සඳහා තාප්පයෙන් තබා ඇති බට හා කවුලු ඉවත් කර දෙන ලෙස ඉල්ලමින් 2018.04.09 දිනැතිව යොමු කරන ලද ලිපිය සම්බන්ධයෙන් තාක්ෂණ නිලධාරි විසින් ඉදිරිපත් කරන ලද වාර්තාවට අනුව ඉදිරි කාරක සභාව පැවැත්වෙන දින මේ හා සම්බන්ධ පාර්ශවයන් කැඳවා සාකච්ඡා කිරිම සුදුසු බවට කාරක සභාව තීරණය කරන ලදී.

8. ''වේරගොල්ල මාර්ගය සංවර්ධනය කිරිම." යන හිසින් යුතුව 2018.04.24 දිනැතිව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අරුණ පී. දිවිගල්ල මැතිතුමා විසින් යොමු කරන ලද ලිපිය සම්බන්ධයෙන් තවත් හිස් තාර බැරල් 50 ක් ලබා ගැනීමෙන් පසුව ඉතිරි කොටස සංවර්ධනය කිරිමටත් මාර්ගයට සිදු වූ අලාභ හානිය අයකර ගැනීම සඳහා මහින්ද ප්‍රනාන්දු යන අයට විරුද්ධව නඩු පැවරීමටත් කාරක සභාව තීරණය කරන ලදී.

9. රංවල පහන ළඟින් පුවක්පිටිය දකුණ කනිෂ්ඨ විද්‍යාලය අසලින් පටන් ගන්නා ගල්කන්ද පාර මීටර් 75 ක් දුරට සංවර්ධනය කළ යුතු බව දන්වා ''ගල්කන්ද පාර ප්‍රතිසංස්කරණය කිරීම." යන හිසින් යුතුව 2018.04.23 දිනැතිව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අරුණ පී. දිවිගල්ල මැතිතුමා විසින් යොමු කරන ලද ලිපිය සම්බන්ධයෙන් තාක්ෂණ නිලධාරි විසින් රු. 344,836.50 ක ඇස්තමේන්තුවක් සකස් කර ඉදිරිපත් කළ අතර අදාල ප්‍රතිපාදන වෙන් කරවා ගැනීමෙන් පසුව මේ පිළිබඳව සලකා බැලීම සුදුසු බවට කාරක සභාව තීරණය කරන ලදී.

10. දිද්දෙණිය උතුර බණ්ඩාරවත්ත ප්‍රජා ශාලාව පිහිටා ඇති ඉඩම ප්‍රාදේශීය සභාව සතු ඉඩමක්ද යන්න සොයා බලා එම භූමියේ ඇති ඉතිරි බිම් කොටසෙහි මාතෘ සායනයක් සාදා දෙන ලෙස ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ.ඩී.ජී. ස්වර්ණලතා මැතිතුමිය විසින් 2018.04.24 දිනැතිව යොමු කරන ලද ලිපිය සම්බන්ධයෙන් තාක්ෂණ නිලධාරි විසින් ඉදිරිපත් කරන ලද වාර්තාවට අනුව මෙහි අයිතිය නිරවුල් කර ගැනිම සම්බන්ධයෙන් කටයුතු සිදු කිරිම සඳහා සභාවේ නිතිඥතුමියට භාර දීම සුදුසු බවට කාරක සභාව තීරණය කරන ලදී.

11. පිටුම්පේ සෝමානන්ද මාවතේ සිට වවුල් කැලේ හා මුස්ලිම් ගම්මානයට හැරෙන තුංමං හංදියට මායිම්ව පිහිටා ඇති ''Plan No: 895 පෙන්නුම් කරන කාණුව සම්බන්ධව" යන හිසින් යුතුව 2018.04.20 දිනැතිව එච්. එච්. නිශාන්ත නන්දන මයා විසින් යොමු කරන ලද ලිපිය සම්බන්ධයෙන් අවම වියදමක් යොදවා සුදුසු පරිදි සංවර්ධනය කිරිම සඳහා රු. ලක්ෂ 2 ½ ක දල ඇස්තමේන්තුවක් තාක්ෂණ නිලධාරි විසින් ඉදිරිපත් කරන ලද අතර අදාල ප්‍රතිපාදන වෙන් කරවා ගැනීමෙන් පසුව මේ පිළිබඳව සලකා බැලීම සුදුසු බවට කාරක සභාව තීරණය කරන ලදී.

12. හොරණ - පාදුක්ක ප්‍රධාන මාර්ගයේ සිට ගලා එන වැසි ජලය නිසි පරිදි බැස යාමට කොන්ක්‍රීට් යොදා කාණුවක් සකස් කර දෙන ලෙස ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අශෝක වැලිකල මැතිතුමා විසින් 2018.04.22 දිනැතිව යොමු කරන ලද ලිපිය සම්බන්ධයෙන් තාක්ෂණ නිලධාරී විසින් ඉදිරිපත් කරන ලද වාර්තාවට අනුව අදාල කාණුව භෞතික පිහිටීම තහවුරු කිරිම සඳහා මැනුමක් කර ඒ අනුව පිඹුරු සැලැස්මක් පිළියෙල කර ඉඩම් වලින් කාණුව සඳහා වෙන් කරන ප්‍රමාණයට අදාලව සභාවට පැවරීම්

කටයුතු සිදු කිරීමෙන් පසුව සංවර්ධන කටයුතු සිදු කිරීමට කාරක සභාව තීරණය කරන ලද අතර, අදාල පිඹුරුපත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අශෝක වැලිකල මැතිතුමා විසින් ගාස්තු අය කිරීමකින් තොරව සකස් කර දීමට එකගතාවය පල කරන ලදී.

13. උඩුමුල්ල කොට්ඨාසයේ යටවතුර ගමේ පිහිටි සුදුවැලිකැටිය මාර්ගයේ දැනට කොන්ක්‍රීට් අතුරා ඇති කොටසට අමතරව ඉතිරි කොටස ද කොන්ක්‍රීට් අතුරා දෙන ලෙස ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අශෝක වැලිකල මැතිතුමා විසින් 2018.04.22 දිනැතිව යොමු කරන ලද ලිපිය සම්බන්ධයෙන් මන්ත්‍රීතුමාගේ එකගත්වයෙන් මුල් 100 m කොටස කොන්ක්‍රීට් කර සකස් කිරීම සදහා රු. ලක්ෂ 6 ½ ක දල ඇස්තමේන්තුවක් තාක්ෂණ නිලධාරි විසින් ඉදිරිපත් කල අතර අදාල ප්‍රතිපාදන වෙන් කරවා ගැනීමෙන් පසුව මේ පිළිබදව සලකා බැලීම සුදුසු බවට කාරක සභාව තීරණය කරන ලදී.

14. උඩුමුල්ල කොට්ඨාසයේ කහවල ගමෙහි පිහිටි රණවිරු සුජිත් ප්‍රියන්ත මාවතේ කොටසක් කොන්ක්‍රීට් යොදා සකසා ඇති අතර එම මාර්ගයේ මැද කොටස කොන්ක්‍රීට් හෝ තාර අතුරා සංවර්ධනය කර දෙන ලෙස ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අශෝක වැලිකල විතානගේ මැතිතුමා විසින් 2018.04.22 දිනැතිව යොමු කරන ලද ලිපිය සම්බන්ධයෙන් 150 m ක් පමණ වන මෙම කොටස තාර යොදා සංවර්ධනය කිරීම සදහා රු. ලක්ෂ 05 ක පමණ මුදලක් වැයවන බවට දල ඇස්තමේන්තුවක් තාක්ෂණ නිලධාරි විසින් ඉදිරිපත් කල අතර අදාල ප්‍රතිපාදන වෙන් කරවා ගැනීමෙන් පසුව මේ පිළිබදව සලකා බැලීම සුදුසු බවට කාරක සභාව තීරණය කරන ලදී.

15. වේරගොල්ල උතුර ප්‍රධාන මාර්ගය සහ මහවෙදගේ බෙහෙත් ශාලාව අසලින් ඇති මීපලාව මාර්ගය ප්‍රිමික්ස් යොදා සංවර්ධන කරදෙන ලෙස ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අරුණ පී. දිවිගල්ල මැතිතුමා විසින් 2018.04.23 දිනැතිව යොමු කරන ලද ලිපිය සම්බන්ධයෙන් මෙම මාර්ගය තාර දමා සංවර්ධනය කිරීම සදහා රු. ලක්ෂ 05 ක දළ ඇස්තමේන්තුවක් තාක්ෂණ නිලධාරි විසින් ඉදිරිපත් කරන ලද අතර අදාල ප්‍රතිපාදන වෙන් කරවා ගැනීමෙන් පසුව මේ පිළිබදව සලකා බැලීම සුදුසු බවට කාරක සභාව තීරණය කරන ලදී.

16. ''පාරක් කොන්ක්‍රීට් කිරීම සඳහා" යන හිසින් යුතුව 2018.04.24 දිනැතිව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ.ඩී.ජී. ස්වර්ණලතා මැතිතුමිය විසින් දිද්දෙණිය දකුණ ග්‍රාමසේවා වසමේ තැන්නපිට හේන පාරට මීටර් 300 ක් පමණ මාර්ගය සහ දිද්දෙණිය බංඩාරවත්ත කරුණාපාල මහතාගේ කඩය අසලින් ඇති හරස් මීටර් 150 ක් පමණ මාර්ගය තාර හෝ කොන්ක්‍රීට් අතුරා පිළිසකර කර දෙන ලෙස ඉල්ලා යොමු කරන ලද ලිපියේ සඳහන් පළමු මාර්ගය සභාවට පවරා නොමැති බැවින්, එම මාර්ගය සභාවට පවරා ගැනීමෙන් පසුව ඇස්තමේන්තු සකස් කිරීම සුදුසු බවත්, දෙවන මාර්ගය සඳහා රු. 359,172.78 ක ඇස්තමේන්තුවක් තාක්ෂණ නිලධාරි විසින් ඉදිරිපත් කරන ලද අතර අදාල ප්‍රතිපාදන වෙන් කරවා ගැනීමෙන් පසුව මේ පිළිබදව සලකා බැලීම සුදුසු බවට කාරක සභාව තීරණය කරන ලදී.

17. අරුක්වත්ත, වත්ත ප්‍රදේශයේ පදිංචිකරුවන්ගේ ඉඩම් වලට අයත් ජලය බැස යන ප්‍රධාන ජල කාණුව අවහිර කිරීම සම්බන්ධව පාදුක්ක, අරුක්වත්ත උතුර, අරලිය මාවත පදිංචි ප්‍රදේශවාසීන් 9 දෙනෙකුගේ අත්සනින් යුක්තව 2018.04.23 දිනැතිව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් යසසිරි කළුපහන මැතිතුමා විසින් යොමු කරන ලද ලිපිය සම්බන්ධයෙන් තාක්ෂණ නිලධාරි විසින් දැනට පවතින කාණුව මගින් ස්වාභාවිකව ජලය බැස යන බවට වාර්තා කර ඇති බවට තාරක සභාව දැනුවත් කරන ලදී.

18. ''පාරක් කොන්ක්‍රීට් කර ගැනීම සඳහා" යන හිසින් යුතුව 2018.04.24 දිනැතිව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ.ඩී.ජී. ස්වර්ණලතා මැතිතුමිය විසින් 443 සී ඉහල හංවැල්ල දකුණ ග්‍රාමසේවා වසමේ බඳුවත්ත ගල්මුල්ල පාරෙන්, ලුවිස් කන්දට යන පාර මීටර් 150 ක් පමණ දුරට කොන්ක්‍රීට් අතුරා දෙන ලෙස යොමු කරන ලද ලිපිය සම්බන්ධයෙන් තාක්ෂණ නිලධාරි වාර්තාවට අනුව මෙම මාර්ගය සභාව සතු මාර්ගයක් නොවන බැවින් මෙම ඉල්ලීම ඉටු කළ නොහැකි බවට කාරක සභාව තීරණය කරන ලදී.

19. ''පාරක් ප්‍රතිසංස්කරණය කර ගැනීම සඳහා" යන හිසින් යුතුව 2018.04.24 දිනැතිව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ.ඩී.ජී. ස්වර්ණලතා මැතිතුමිය විසින් නිරිපොල ගල්කැටිය කන්ද පාර කිලෝමීටර් එකක් පමණ මාර්ගය ප්‍රතිසංස්කරණය කර දෙන ලෙස යොමු කරන ලද ලිපිය සම්බන්ධයෙන් තාක්ෂණ නිලධාරි විසින් ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තුව අනුව මෙම මාර්ගය තාර යොදා ප්‍රතිසංස්කරණය කිරිම සඳහා රු. 567,515.35 ක මුදලක් වැය බැවින් අදාල ප්‍රතිපාදන වෙන් කරවා ගැනීමෙන් පසුව මේ පිළිබඳව සලකා බැලීම සුදුසු බවට කාරක සභාව තීරණය කරන ලදී.

20. අරුක්වත්ත, අමරසිංහ මාවත ප්‍රධාන මාර්ගයේ පිවිසුම් ස්ථානයේ සිට මීටර් 300 ක් පමණ දුර තාර හෝ කොන්ක්‍රීට් යොදා දෙන ලෙස ඉල්ලමින් 2018.04.24 දිනැතිව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් යසසිරි කළුපහන මැතිතුමා විසින් යොමු කරන ලද ලිපිය සම්බන්ධයෙන්, මෙහි ආරම්භක කොටසේ 300 m ක් පමණ දුරක් අළුත්වැඩියා කළ යුතු බවත් තාර යොදා ප්‍රතිසංස්කරණය කිරිම සඳහා රු. ලක්ෂ 08 ක පමණ මුදලක් වැයවන බවට දල ඇස්තමේන්තුවක් තාක්ෂණ නිලධාරි විසින් ඉදිරිපත් කල අතර අදාල ප්‍රතිපාදන වෙන් කරවා ගැනීමෙන් පසුව මේ පිළිබඳව සලකා බැලීම සුදුසු බවට කාරක සභාව තීරණය කරන ලදී.

21. බොල්ලතාව ග්‍රාම සේවා වසමේ බොල්ලතාව, වඩු මඩුව මාර්ගය සම්පූර්ණයෙන්ම තාර ගැලවී විනාශ වී ඇති බැවින් එම පාර අළුතින් නිම කර දෙන ලෙස 2018.04.20 දිනැතිව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නන්ද කුමාරසිංහ මැතිතුමා විසින් යොමු කරන ලද ලිපිය සම්බන්ධයෙන් තාක්ෂණ නිලධාරි විසින් ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තුව අනුව රු. 268,228.99 ක මුදලක් වැය වන බැවින් අදාල ප්‍රතිපාදන වෙන් කරවා ගැනීමෙන් පසුව මේ පිළිබඳව සලකා බැලීම සුදුසු බවට කාරක සභාව තීරණය කරන ලදී.

22. වෙරගල ඩේල්වත්ත පිවිසුම් මාර්ගයේ දැඩි ලෙස සෝදා පාලුවට ගොස් ඇති මීටර් 150 ක පමණ කොටස තාර යොදා සංවර්ධනය කර දෙන ලෙස සහ මාහිංගල කැටකැල්ල පාරේ අබලන් වූ බෝක්කුව අළුත්වැඩියා කර දෙන ලෙස ඉල්ලමින් 2018.04.22 දිනැතිව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චින්තක දේවින්ද සමරවීර මැතිතුමා විසින් යොමු කරන ලද ලිපිය සම්බන්ධයෙන් තාක්ෂණ නිලධාරි වාර්තාවට අනුව වෙරගල ඩේල් වත්ත පිවිසුම් මාර්ගයේ අළුත්වැඩියා කළ යුතු 150 m කොටස තාර දමා සංවර්ධනය කිරිම සඳහා රු. ලක්ෂ 4 ½ ක පමණ මුදලක් වැය වන අතර ප්‍රතිපාදන වෙන් කරවා ගැනීමෙන් පසුව මේ පිළිබඳව සලකා බැලීම සුදුසු බවටත් මාහිංගල කැටකැල්ල පාරේ බෝක්කුව ප්‍රාදේශීය සභා මාර්ගයක් නොවන බැවින් සභා ප්‍රතිපාදන යෙදිය නොහැකි බවටත් කාරක සභාව තීරණය කරන ලදී.

23. ''මාර්ග කොන්ක්‍රීට් කර ගැනීම සඳහා " යන හිසින් යුතුව 2018.03.20 දිනැතිව වග - ඉරිදාපොල, ජන උදාන ගම්මානය, අංක 61/25 පදිංචි එන්.එම්. සරත් මංජුල මයා විසින් අයර්වත්ත ජන උදාන ගම්මානයේ ජල ටැංකියට යන මාර්ගය උඩට යන මාර්ගයේ මීටර් 70 ක් පමණ කොටස මිනුම් කටයුතු සිදුකොට මාර්ගය පුළුල් කර කොන්ක්‍රීට් කර දෙන ලෙස හා උණ පඳුර ළඟ කඩේ සිට උඩ පාර ද අළුත්වැඩියා කර දෙන ලෙස ඉල්ලා යොමු කරන ලද ලිපිය සම්බන්ධයෙන්, ලිපියේ සඳහන් පළමු පාරේ ස්ථාන කොන්ක්‍රීට් කිරිම සඳහා රු. ලක්ෂ 6 ක පමණ මුදලක් හා දෙවැනි මාර්ගය සඳහා රු. ලක්ෂ 10 ක පමණ මුදලක් වැය වන බවට හා මාර්ගය පුළුල් කිරිම සඳහා මායිම් උප ලේඛන නොමැති බැවින් අදාල ප්‍රවේශය දෙපස පදිංචිකරුවන්ගෙන් පිඹුරු පිටපත් ලබා ගෙන පුළුල් කිරිම කළ යුතු බවටත් තාක්ෂණ නිලධාරි විසින් ඉදිරිපත් කරන ලද වාර්තාවේ සඳහන් අතර, ප්‍රතිපාදන වෙන් කරවා ගැනීමෙන් පසුව මේ පිළිබඳව සලකා බැලීම සුදුසු බවට කාරක සභාව තීරණය කරන ලදී.

24. ''ගල්දොල පාර අතුරු මාර්ගය ජනසවි මාවත අවහිර කිරීම" යන හිසින් යුතුව 2018.02.28 දිනැතිව කලුඅග්ගල - වග, අංක 309/සී හි පදිංචි එච්.පී. සරත් විමලවීර මයා විසින් අංක 436/ඒ සුදුවැල්ල ග්‍රාම නිලධාරී වසමේ ගල්දොල පාර අතුරු මාර්ගය වන ජනසවි මාර්ගය අවහිර කරමින් කර ඇති සියලු බාධාවන් ඉවත් කර දෙන ලෙස ඉල්ලමින් යොමු කරන ලද ලිපිය සම්බන්ධයෙන්, මෙම මාර්ගය අවහිර වීමක් ලෙස සඳහන් කරන්නේ මීට වසර 10 කට පමණ පෙර සිටුවන ලද පුවක්ගස් වල කම්බි ඇදීමක් බැවින් එය දැන් සිදු වූ දෙයක් නොවන බවත්, දැනට මෙම මාර්ගයේ ගමන් කිරිමට අවහිරතාවයක් නොමැති බවත් තාක්ෂණ නිලධාරි විසින් කාරක සභාව දැනුවත් කරන ලදී.

25. ''මාර්ග පද්ධතියට අදාල කාණු පද්ධතිය පිළිසකර කරගැනීම සම්බන්ධවයි" යන හිසින් යුතුව 2018.04.22 දිනැතිව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වරුණ දිලිප් කුමාර මැතිතුමා විසින් උග්ගල්ල, කොට්ඨාසයට අයත් අංගම්පිටිය, හල්පේ, ප්‍රාදේශීය සභාවට අයත් මාර්ගවල කාණු පද්ධතිය අවහිරව ඇති බැවින් කාණු පද්ධතිය ජලය බැස යන පරිදි සකස් කිරීම, තාර හෝ කොන්ක්‍රීට් අළුතින් යොදන්නේ නම් කාණු පද්ධතිය පිළිසකර කිරීම පිළිබඳව දැඩි අවධානය යොමු කරන ලෙසත් සහ ජල ව්‍යාපෘතිය මඟින් සිදුකල කාර්යයන් නැවත පිළිසකර කිරීමේ නිසි පරිදි පිළිසකර නොවූ තැන් පිළිබඳව අවධානය යොමු කරන ලෙසත් යෝජනා කරමින් යොමු කරන ලද ලිපිය සම්බන්ධයෙන් තාක්ෂණ නිලධාරි වාර්තාවට අනුව සභාවේද දායකත්වය ලබා ගෙන අදාල ප්‍රදේශවාසීන්ගේ සහාය ඇතිව ශ්‍රමදාන මගින් ප්‍රවේශ වල ඇති කාණු සකසා ගැනීම, කාණු පද්ධතිය කොන්ක්‍රීට් කර සැකසීම වඩාත් සුදුසු බැවින් අදාල ප්‍රතිපාදන වෙන් කරවා ගැනීමෙන් පසුව සලකා බැලීම සුදුසු බවටත්, ජල ව්‍යාපෘති සම්බන්ධයෙන් ගැටළු පවතින ස්ථාන පිළිබඳව කොට්ඨාසයේ මන්ත්‍රීතුමාගෙන් ලිඛිතව ලබා ගෙන ඉදිරි කාරක සභා වලදී සුදුසු විසඳුම් ලබා දීම සුදුසු බවටත් කාරක සභාව තීරණය කරන ලදී.

26.2018.04.24 දිනැතිව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කෝකිල සම්පත් මැතිතුමා විසින් යොමු කරන ලද ලිපි සලකා බැලූ කාරක සභාව, ඒ සම්බන්ධයෙන් තාක්ෂණ නිලධාරී විසින් පහත ඇස්තමේන්තු ඉදිරිපත් කර ඇත.

i. මුරුතගම නාගරුක්ඛාරාම මාර්ගයේ ඉතිරි කොටස තාර යොදා අළුත්වැඩියා කිරීම සඳහා රු. 505,212.70.

ii. රණවිරුගම අංක 01 නිවස ඉදිරිපිට වතුර බසින ප්‍රධාන කාණුව කොන්ක්‍රීට් කිරීම හා රණවිරු ගම්මානයට ඇතුළුවීමට ඇති ප්‍රධාන මාර්ගය තාර දමා කාණු පද්ධතිය සකස් කිරීම. රු. 1,249,415.14

iii. සාලාව VC නිවාස වලට යන ප්‍රධාන මාර්ගයේ බුදු මැදුර අසල ඇති මාර්ගය අළුත්වැඩියා කිරීම.

මෙම මාර්ගය සභාව සතු නොවේ.

iv. ආනන්දගම ගම්මානයේ සිට වතුර බසින ප්‍රධාන කාණු පද්ධතියක් ඉදිකිරීම. රු. 285,931.02.

v. දාතුරුගොඩ ත්‍රීවිල් වැඩපල අසල සිට පහලට ඇති මාර්ගය පිළිසකර කිරීම. රු. 434,490.43.

ප්‍රතිපාදන වෙන් කරවා ගැනීමෙන් පසුව මේ පිළිබඳව සලකා බැලීම සුදුසු බවට කාරක සභාව තීරණය කරන ලදී.

## 02. ලිපි ලේඛන සලකා බැලීම.

01. වේරගල මාහිංගල දෙල්ගහපිටිය මාර්ගයේ දැඩි ලෙස අබලන් වූ 200 m තාර දැමීම යන හිසින් යුතුව 2018.05.21 දිනැතිව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චින්තක දේවින්ද සමරවීර මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ලිපිය සලකා බැලූ කාරක සභාව, මේ සඳහා තාක්ෂණ නිලධාරී වාර්තාවක් හා දල ඇස්තමේන්තුවක් ලබා ගැනීම සුදුසු බවට තීරණය කරන ලදි.

02. හංවැල්ල, දිද්දෙණිය සමගි අන්‍යොන්‍යාධාර හා සුභ සාධක සමිතිය විසින් දිද්දෙණිය පොදු සුසාන භූමියේ මැනුම් කටයුතු සිදු කර අනවසරයෙන් ඉදිකර ඇති මාර්ගය ඉවත් කර සුසාන භූමිය ආරක්ෂා කර දෙන ලෙස සභාපති, සීතාවක ප්‍රාදේශීය සභාව වෙතටද පිටපතක් සහිතව ප්‍රාදේශීය ලේකම්, හංවැල්ල වෙත ඉදිරිපත් කරන ලද ලිපිය සම්බන්ධයෙන් කාරක සභාව විසින් කරුණු සාකච්ඡා කරන ලද අතර, මෙම සුසාන භූමියේ අයිතිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට පවතින බැවින් එය ප්‍රාදේශීය සභාවට පවරා ගැනීම සම්බන්ධයෙන් මීට ඉහතදීද සාකච්ඡා කළ බවට ලේකම්තුමා විසින් කාරක සභාව දැනුවත් කරන ලදී. ප්‍රථමයෙන් මෙම සුසාන භූමිය ප්‍රාදේශීය සභාව වෙත පවරා ගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම් හමු වී සාකච්ඡා කිරීම සුදුසු බවට කාරක සභාව තීරණය කරන ලදී.

03. ප්‍රිමික්ස් යොදා වේරගොල්ල ගමට පිවිසෙන ප්‍රධාන මාර්ගය සංවර්ධනය කිරීමේ කාර්යය කඩිනම් කර දෙන ලෙස ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.පී.ඒ.කේ. ගුණරත්න මැතිතුමා විසින් 2018.05.17 දිනැතිව යොමු කරන ලද ලිපිය සලකා බැලූ කාරක සභාව, මේ සඳහා තාක්ෂණ නිලධාරී වාර්තාවක් හා දල ඇස්තමේන්තුවක් ලබා ගැනීම සුදුසු බවට තීරණය කරන ලදි.

04. වේරගල හා අරුක්වත්ත යන කොට්ඨාස දෙක වෙන් වන වෙහෙරගල මාවත මේ වන විට දැඩි ලෙස අබලන් වී ඇති බැවින් මෙම මාර්ගයට ප්‍රමුඛතාවයක් දක්වා පිළිසකර කර දෙන ලෙස ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චින්තක දේවින්ද සමරවීර මැතිතුමා විසින් 2018.05.21 දිනැතිව යොමු කරන ලද ලිපිය සලකා බැලූ කාරක සභාව, මේ සඳහා තාක්ෂණ නිලධාරී වාර්තාවක් හා දල ඇස්තමේන්තුවක් ලබා ගැනීම සුදුසු බවට තීරණය කරන ලදි.

05. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයෝම මධු ප්‍රසාද් දේවගේ මැතිතුමා විසින් 2018.05.20 දිනැතිව පහළ පාදුක්ක ඩී.ඕ. නිමල්සිරි මාවතේ කොඩිතුවක්කු මහතාගේ නිවස අසල වතුර බැස යන බෝක්කුව පස් පිරී වතුර බැස යාම අවහිර වී ඇති බැවින් බෝක්කුව ගොඩ දමා ප්‍රතිසංස්කරණය කර දෙන මෙන් ඉල්ලා යොමු කරන ලද ලිපිය සලකා බැලූ කාරක සභාව, මේ සඳහා තාක්ෂණ නිලධාරී වාර්තාවක් හා දල ඇස්තමේන්තුවක් ලබා ගැනීම සුදුසු බවට තීරණය කරන ලදී.

06. හල්පේ ඒ.එස්.පී ඉඩමෙහි පස් ඉවත් කිරීම සම්බන්ධවයි යන හිසින් යුතුව 2018.05.20 දිනැතිව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වරුණ දිලිප් කුමාර මැතිතුමා විසින් කරුණු හයක් පිළිබඳව විමසමින් ඉදිරිපත් කරන ලිපිය සම්බන්ධයෙන් කාරක සභාව දිර්ඝ වශයෙන් කරුණු සාකච්ඡා කරන ලදී. පස් ඉවත් කිරීම සම්බන්ධයෙන් 2017.12.31 දින දක්වා පමණක් ප්‍රාදේශීය සභාවෙන් අවසරය ලබා දී තිබූ අතර ඉන් පසුවද අවසර ලබා ගැනීම සඳහා ඉල්ලීම් සිදු කළද මේ වන විට ඒ සඳහා කිසිදු අවසරයක් ප්‍රාදේශීය සභාවෙන් ලබා දී නොමැති බවට ලේකම්තුමා විසින් කාරක සභාව වෙත කරුණු ඉදිරිපත් කරන ලද අතර, මෙම පස් ප්‍රවාහනය නතර කරන ලෙසට අදාල පුද්ගලයාට සහ මේ සම්බන්ධයෙන් පොලිස් ස්ථානාධිපතිතුමා දැනුවත් කිරීම සුදුසු බවට තීරණය කරන ලදී.

07. හංවැල්ල, ඉහළ හංවැල්ල අංක 480/ඒ හි පදිංචි නිමල් ලියනවඩු මයා විසින් ගම්වැසියන් වෙනුවෙන් 2018.05.17 දිනැතිව හංවැල්ල, ඉහළ ඊරියගොල්ල පහත්ගම 443 ග්‍රාම සේවා වසමට අයත් මීගහවත්ත පාර මුල් කොටස සහ පළමු හරස් පටුමග තාර දමා වැසි ජලය දෙපැත්ත බැස යන ආකාරයට සකස් කර දෙන ලෙස ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දනුෂ්කි ප්‍රභානි අල්මේදා මැතිතුමිය මගින් ඉදිරිපත් කරන ලද ලිපිය සලකා බැලූ කාරක සභාව, මේ සඳහා තාක්ෂණ නිලධාරී වාර්තාවක් හා දල ඇස්තමේන්තුවක් ලබා ගැනීම සුදුසු බවට තීරණය කරන ලදී.

08. 426 /ඒ, මුරුතගම වසමට ඇතුළු වන පාර අයිනේ ඇති පොදු නාන ළිදට අයත් භූමි ප්‍රමාණය මැනුම් කර ජනතාවට අවශ්‍ය පරිදි සකසා දෙන ලෙස හා මුරුතගම ක්‍රීඩා පිටියෙහි මායිම් වෙනස් වෙමින් පවතින බවට පැමිණිලි ලැබී ඇති බැවින් එම භූමි ප්‍රමාණයද මැනුම් කර ක්‍රීඩා උපකරණ සහිතව කුඩා ළමා ක්‍රීඩා පිටියක් ලෙස සකසා දෙන ලෙස ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඉන්ද්‍රානි ඩයස් මැතිතුමිය විසින් 2018.05.21 දිනැතිව ඉදිරිපත් කරන ලද ලිපිය සලකා බැලූ කාරක සභාව, මේ සඳහා තාක්ෂණ නිලධාරී වාර්තාවක් හා දල ඇස්තමේන්තුවක් ලබා ගැනීම සුදුසු බවට තීරණය කරන ලදී.

09. කොස්ගම විලේජ් හි නිවාස වාසීන්ගේ සුභ සාධක සහ අන්‍යෝන්‍යාධාර සංගමය විසින් 2018.05.15 දිනැතිව කොස්ගම විලේජ් හි මාර්ග හා කාණු පද්ධතිය සංවර්ධනය කර ගැනීම යන හිසින් යුතුව දැනට නිවාස වාසින් හා අවට ගම් වාසින්ද මේ නිසා මහත් පීඩාවන්ට මුහුණ පා ඇති බවත් සඳහන් කරමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සමන්ත උදය කුමාර ගමගේ මැතිතුමා මගින් ඉදිරිපත් කරන ලද ලිපිය සලකා බැලූ කාරක සභාව, මාර්ග පද්ධතිය සංවර්ධනය කිරීම සඳහා විශාල මුදලක් වැය වන බැවින් ප්‍රථමයෙන් මෙම මාර්ගයේ ජලය බැස යන පරිදි සකස් කිරීම සඳහා තාක්ෂණ නිලධාරී වාර්තාවක් ලබා ගැනීම සුදුසු බවට තීරණය කරන ලදී.

10. කොස්ගම, බොල්ලතාව, ශ්‍රී සුගතවංශ අවමංගල්‍යාධාර හා සමාජ සේවා සංවර්ධන සමිතියේ 2018.05.21 දිනැති ඉල්ලීම් ලිපියක්ද සමගින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්. නන්ද කුමාරසිංහ මැතිතුමා විසින් බොල්ලතාව සුසාන භූමියට යාබද ඉඩමේ පදිංචි පුද්ගලයින්ට නිවසට යාම සඳහා පාරක් නොමැති බැවින් සුසාන භූමියට යන පාර දැනට භාවිතා කරන බවත් සුසාන භූමියෙන් වම්පසින් මෙම නිවසට පාරක් ලබා දීම සුදුසු බව සඳහන් කරමින් ඉදිරිපත් කරන ලද ලිපිය සලකා බැලූ කාරක සභාව, මේ සඳහා තාක්ෂණ නිලධාරි වාර්තාවක් ලබා ගැනීම සුදුසු බවට තීරණය කරන ලදී.

11. කොස්ගම, අළුත් අම්බලම, ජය මාවත, අංක 142/සී හි පදිංචි පී.වී.අයිරාංගනී මිය විසින් වසර 22 ක් පමණ නොකඩවා පාවිච්චි කරනු ලබන පානීය ජල යෝජනා ක්‍රමයේ ජල නල කඩා දමා ජලය විසන්ධි කිරීම සම්බන්ධවයි යන හිසින් යුතුව 2018.05.01 දිනැතිව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සමන්ත උදය කුමාර ගමගේ මැතිතුමා මගින් සභාපතිතුමා, සීතාවක ප්‍රාදේශීය සභාව වෙතද පිටපතක් සහිතව ප්‍රාදේශීය ලේකම්, සීතාවක වෙත යොමු කරන ලද ලිපිය සලකා බැලූ කාරක සභාව, මේ සම්බන්ධයෙන් තාක්ෂණ නිලධාරි වාර්තාවක් ලබා ගැනීම සුදුසු බවට තීරණය කරන ලදී.

12. පාදුක්ක, මීපේ, දෙකඳුවල පාර නො. 171/3 හි පදිංචි ඩබ්.ඩී.ආර්. විතාන මයා විසින් මාවතගම අළුපොතවත්ත කොටස මායිමේ පිහිටා ඇති අනතුරුදායක රබර් ගස් ඉවත් කිරීම හා වතුයායේ සිට ගලා බසින විශාල ජලකඳ සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙස ඉල්ලමින් සභාපතිතුමා සීතාවක ප්‍රාදේශීය සභාව වෙතද පිටපතක් සහිතව කොස්ගම, ශාලාව වත්ත, පුස්වැල්ලාව වැවිලි සමාගම, වතු අධිකාරිතුමා වෙත 2018.04.15 දිනැතිව යොමු කරන ලද ලිපිය සලකා බැලූ කාරක සභාව, මේ සම්බන්ධයෙන් වතු අධිකාරිතුමා දැනුවත් කිරීම සුදුසු බවට තීරණය කරන ලදී.

13. පාදුක්ක, පත්තිනි පාර පදිංචිකරුවන් විසින් 2018.04.15 දිනැතිව පත්තිනි පාර රක්ෂිතයේ අවහිරතාවය ඉවත් කර ගැනීම සඳහා එහි පදිංචිකරුවන් නම දෙනෙකුගේ අත්සනින් යුතුව යොමු කරන ලද ලිපිය සලකා බැලූ කාරක සභාව, මේ සම්බන්ධයෙන් තාක්ෂණ නිලධාරි වාර්තාවක් ලබා ගැනීම සුදුසු බවට තීරණය කරන ලදී.

14. තුම්මෝදර, මාවරගොඩැල්ල අංක 312/1/1 හි පදිංචි එච්.ජී. ඤානසිරි මයාගේ ඉල්ලීම් ලිපියද සමගින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සමන්ති චන්ද්‍රිකා දමයන්ති මැතිතුමිය විසින් 2018.05.20 දිනැතිව ප්‍රාදේශීය සභාවට අයත් මාවරගොඩැල්ල පන්සල අසල ප්‍රේමසිරි මාවත ඉතා අබලන් තත්වයේ පවතින බැවින් එම මාර්ගය කඩිනමින් පිළිසකර කර දෙන ලෙස ඉල්ලමින් ඉදිරිපත් කරන ලද ලිපිය සලකා බැලූ කාරක සභාව, මේ සඳහා තාක්ෂණ නිලධාරි වාර්තාවක් හා දළ ඇස්තමේන්තුවක් ලබා ගැනීම සුදුසු බවට තීරණය කරන ලදී.

15. දිද්දෙණිය පොදු සුසාන භූමිය මැදින් ස්කාගාර ගබඩාවක් වෙත යාමට අනවසරයෙන් තනා ඇති පාර ඉවත් කර දෙන ලෙස ඉල්ලා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ජේ.ඩී.ජී. ස්වර්ණලතා මැතිතුමිය විසින් 2018.05.05 දිනැතිව ඉදිරිපත් කරන ලද ලිපිය සලකා බැලූ කාරක සභාව, මේ සම්බන්ධයෙන් තාක්ෂණ නිලධාරි වාර්තාවක් ලබා ගැනීම සුදුසු බවට තීරණය කරන ලදී.

16. කිඹුල් බෙනය අතුරු මාර්ගයේ ආරම්භයේ මායිම් වැටකින් හා ස්ථිර අත්තිවාරමක් පවතින බවත් මෙම මායිම් වැට ඉවත් කර මෙම පාරේ ආරාවුල විසදා දෙන ලෙස ඉල්ලමින් 2018.05.16 දිනැතිව කිඹුල් බෙනය පදිංචිකරුවන් විසින් යොමු කරන ලද ලිපිය සලකා බැලූ කාරක සභාව, මේ සම්බන්ධයෙන් තාක්ෂණ නිලධාරි වාර්තාවක් ලබා ගැනීම සුදුසු බවට තීරණය කරන ලදී.

17. 2018.05.15 දිනැතිව පාදුක්ක, රිටිගහහේන, මාවතගම, අංක 127/8 හි පදිංචි සෙනරත් ජිනසේන මයා විසින් මාවතගම ගුරුගේ වෙන්දේසි ඉඩම සඳහා වෙන් කර ඇති පොදු පහසුකම් ඉඩමෙහි වෙනත් බාහිර පුද්ගලයින් පැමිණ අශීලාචාර අන්දමින් ක්‍රීඩාවෙහි නිරත වන බැවින් මේ තත්වය පිළිබඳව අවධානය යොමු කර පෙර පැවති සාමකාමී පරිසරය රැක දෙන ලෙස ඉල්ලමින් යොමු කරන ලද ලිපිය සලකා බැලූ කාරක සභාව, මේ සම්බන්ධයෙන් පොලිස් ස්ථානාධිපතිතුමා දැනුවත් කිරීම සුදුසු බවට තීරණය කරන ලදී.

18. බෝපේ, ගමගේවත්ත ජනසවි මාවත යූ.ජී. තිලකරත්න මහතාගේ ඉඩම අවසානයේ ඇති බෝක්කුව නිසියාකාරව යොදා නැති බැවින් එම ජල ප්‍රහාරය නොනිසි අන්දමින් ගලා ගොස් අවට නිවැසියන් අපහසුතාවයට පත් වන බැවින් එය නිසි අයුරින් සකසා දෙන ලෙස ඉල්ලමින් 2018.05.22 දිනැතිව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. කුමුදිනි ජයවර්ධන මැතිතුමිය විසින් ඉදිරිපත් කරන ලද ලිපිය සලකා බැලූ කාරක සභාව, මේ සම්බන්ධයෙන් තාක්ෂණ නිලධාරි වාර්තාවක් හා දළ ඇස්තමේන්තුවක් ලබා ගැනීම සුදුසු බවට තීරණය කරන ලදී.

19. උඩුමුල්ල කොට්ඨාසයේ අංගමුව පාරේ කොටසක් ගමන් කිරීමට නොහැකි තත්වයේ පවතින බැවින් එම මාර්ගයේ කැඩී ඇති ස්ථාන වලට පෙර මුසු තාර යොදා සකස් කර දෙන මෙන් ඉල්ලා 2018.05.20 දිනැතිව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අශෝක වැලිකල මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ලිපිය සලකා බැලූ කාරක සභාව, මේ සම්බන්ධයෙන් තාක්ෂණ නිලධාරි වාර්තාවක් හා දළ ඇස්තමේන්තුවක් ලබා ගැනීම සුදුසු බවට තීරණය කරන ලදී.

20. උඩුමුල්ල කොට්ඨාසයේ ගොවිජන මාවත කෙළවර කොටස කැඩී ගොස් ඇති බැවින් මීටර් 100 ක පමණ දුරක් කොන්ක්‍රීට් යොදා සකස් කර දෙන ලෙස ඉල්ලා 2018.05.20 දිනැතිව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අශෝක වැලිකල මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ලිපිය සලකා බැලූ කාරක සභාව, මේ සම්බන්ධයෙන් තාක්ෂණ නිලධාරි වාර්තාවක් හා දළ ඇස්තමේන්තුවක් ලබා ගැනීම සුදුසු බවට තීරණය කරන ලදී.

21. වේරගොල්ල උතුර වසමෙහි ගල්කන්ද ප්‍රදේශයෙහි ඇල හරහා හියුම් පයිප්ප යොදා පිවිසුමක් සකස් කර දෙන ලෙස ඉල්ලමින් 2018.05.22 දිනැතිව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.පී.ඒ.කේ. ගුණරත්න මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ලිපිය සලකා බැලූ කාරක සභාව, මේ සම්බන්ධයෙන් තාක්ෂණ නිලධාරි වාර්තාවක් හා දළ ඇස්තමේන්තුවක් ලබා ගැනීම සුදුසු බවට තීරණය කරන ලදී.

22. වේරගොල්ල ද පිනැන්ස් සදහම් මාවත මාර්ගය අවහිරතා දුරු කර දෙන ලෙස ඉල්ලමින් 2018.05.22 දිනැතිව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.පී.ඒ.කේ. ගුණරත්න මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ලිපිය සලකා බැලූ කාරක සභාව, මේ සම්බන්ධයෙන් තාක්ෂණ නිලධාරි වාර්තාවක් හා දළ ඇස්තමේන්තුවක් ලබා ගැනීම සුදුසු බවට තීරණය කරන ලදී.

23. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වරුණ දිලිප් කුමාර මැතිතුමා විසින් 2018.05.20 දිනැතිව අංගම්පිටිය ඵවුසි මාර්ගයේ ප්‍රධාන පාලම ගිලා බැස ඇති බැවින් මේ සඳහා සභාව මැදිහත් වී සුදුසු ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙස ඉල්ලමින් ඉදිරිපත් කරන ලද ලිපිය සලකා බැලූ කාරක සභාව, මේ සම්බන්ධයෙන් තාක්ෂණ නිලධාරි වාර්තාවක් හා දළ ඇස්තමේන්තුවක් ලබා ගැනීම සුදුසු බවට තීරණය කරන ලදී.

## 03. සාකච්ඡා සටහන්

01. සීතාවක ප්‍රාදේශිය සභාව මගින් ආරම්භ කිරිමට නියමිත වැඩ ඒකකය මගින් මාස 06 ක් ඇතුළත නඩත්තු කරන ලද මාර්ග පිළිබඳ ලේඛනය කාර්මික සේවා කාරක සභාව වෙත ඉදිරිපත් කරන අතර ඒ අනුව කටයුතු කිරිම සුදුසු බවට තීරණය කරන ලදී.

1.දිද්දෙණිය කම්මල්වත්ත පාර
2.මලගල පොල්කන්ද මාර්ගය ( රඹුටන් ගස් හන්දිය පාර)
3.මාවතගම රිටිගහහේන පාර
4. අංගම්පිටිය උග්ගල්ල පාර
5.බෝපෙ රතුගම මාවත
6.අකරවිට නාගහ යට පාර
7.වග අඹ ගස්යාය පාර
8.වග බොරළුවතැන්න පාර
9.කළුඅග්ගල බේකරිය පාර
10.කොස්ගම අළුබෝදල පාර
11. අරුක්වත්ත ගජ මාවත